**හරිත බලශක්ති සංවර්ධනය සහ බලශක්ති කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම පිළිබඳ ආයෝජන වැඩසටහන (1 වන ව්‍යාපෘතිය) - 2017**

හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම පිළිබඳ ආයෝජන වැඩසටහනේ (1 වන ව්‍යාපෘතිය) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ලංකා විදුලිබල මණ්ඩලය හා ආසියානු සංවර්ධන බැංකුව අතර ඇති කර ගන්නා ලද අංක එස්ආර්අයි 47037 සහ 2014 නොවැම්බර් 20 දිනැති ව්‍යාපෘති ගිවිසුමේ II වගන්තියේ 2.09 (අ) ඡේදය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලසීමාව

වැඩසටහනේ පහසුකම් පරිපාලන සංග්‍රහයට අනුව, විදුලිබල සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ලංකා විදුලිබල මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. පිවිතුරු බලශක්තිය උත්පාදනය, පද්ධතියේ කාර්යක්ෂමතාව හා විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීම මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වේ. පහසුකම් පරිපාලන සංග්‍රහය ප්‍රකාරව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය ඇ.ඩො. මිලියන 220 කට හෙවත් රු. මිලියන 28,509.80 කට සමාන වන අතර එම මුදලින් ඇ.ඩො. මිලියන 180 කට හෙවත් රු. මිලියන 23,326.20 කට සමාන වන මුදලක් මෙම වැඩසටහනේ 1 වන ව්‍යාපෘතිය යටතේ මූල්‍යයනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව (ADB) විසින් එකඟත්වය පළ කර තිබුණි. මූල්‍යනය කිරීම පිළිබඳ විස්තර සහ මූල්‍ය ප්‍රභව පහත සඳහන් කර ඇත.

| ප්‍රභව | ඇ.ඩො. මිලියන | රු. මිලියන |
|---|---|---|
| ආසියානු සංවර්ධන බැංකුව සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත් (OCR) ණය | 121.00 | 15,680.39 |
| ආසියානු සංවර්ධන අරමුදල් ණය | 29.00 | 3,758.11 |
| Agency Franchise Development Loan | 30.00 | 3,887.70 |
| ශ්‍රී ලංකා රජය | 40.00 | 5,183.60 |
| **එකතුව** | 220.00 | 28,509.80 |

මෙම වැඩසටහනේ කටයුතු 2015 පෙබරවාරි 02 දින ආරම්භ කරන ලද අතර 2019 සැප්තැම්බර් 30 දින වන විට ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන්

තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් වැඩසටහනේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් සලකා බැලීමේ දී, වැඩසටහන් කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ වැඩසටහනේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වසනීයභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම, වැඩසටහන මගින් පවත්වා ගෙන යනු ලබන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද වැඩසටහන් වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් වැඩසටහනේ ප්‍රගතිය, වැඩසටහනේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය ආදියෙන් සිදු කරන ලද මිලදී ගැනීම් හඳුනාගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඈ) අක්මුදල් අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, මුදල් ආපසු ගැනීම සහ නැවත පිරවීම පිළිබඳව ව්‍යාපෘතිය මගින් නඩත්තු කරන ලද පොත් සහ වාර්තාවල සත්‍ය වශයෙන් සහ සාධාරණ ලෙස අනාවරණය වී තිබේද යන බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම්කරණ වාර්තා සමඟ සතුටුදායක ලෙස සැසඳී තිබුණේ ද යන බව.

(ඉ) ව්‍යාපෘති ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව ණය යටතේ ආපසු ගැනීම් සිදු කර තිබුණේද යන බව,

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ වැඩසටහනේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(උ) වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව,

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබුණේද යන බව,

(එ) ඉකුත් වසරේ මා විසින් ලබා දෙන ලද විගණන වාර්තාවේ විශේෂයෙන් ඉස්මතු කර දක්වන ලද ගැටළු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකාරීත්වය මගින් සතුටුදායක පියවර ගෙන තිබුණි ද යන්න සහ,

(ඒ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලව කටයුතු කර තිබුණේ ද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

---------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ විස්තර කර ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

--------------

**2.1 මතය**

-----

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මා වෙත සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය මගින් නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ව්‍යාපෘති ගිවිසුමේ නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතාවලට අනුකූලව, ප්‍රතිපූරණය කිරීම සඳහා වන අයදුම්පත් සඳහා උපස්තම්භක වන පරිදි ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශන පිළිබඳව බොහෝ දුරට විශ්වාසය තැබිය හැකි වන බව,

(ඈ) ඉකුත් වසරේ මා විසින් ලබා දෙන ලද විගණන වාර්තාවේ විශේෂයෙන් ඉස්මතු කර දක්වන ලද ගැටළු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකාරීත්වය මගින් සතුටුදායක පියවර ගෙන තිබුණ බව, සහ

(ඉ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලව කටයුතු කර තිබුණ බව.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

--------------------------------------

**2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම**

------------------------------

2007 අගෝස්තු 07 දිනැති අංක එම්ඕඑෆ්පී/ඊආර්ඞී/2007/2 දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛයට අනුව, 2018 මාර්තු 31 දින වන විට විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වූ සමාලෝචිත වර්ෂය සඳහා වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ 2018 ජූනි 05 වන දින දීය.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

යෝජිත මොරගොල්ල ජල විදුලිබල ව්‍යාපෘතිය යටතේ ඉදි කිරීම් සඳහා ඉඩම් අත්පත් කර ගැනීම සඳහා මධ්‍යම පළාතේ උඩපළාත සහ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල තැන්පත් කරන ලද රු. මිලියන 7.20 න් රු. මිලියන 3.50 ක් සමාලෝචිත වසරේ දී ඉඩම් හිමියන් සඳහා නිදහස් කර තිබුණි. කෙසේ වුවද, ඒ පිළිබඳව ගිණුම්කරණ ප්‍රතිකර්ම සිදු නොකරන ලද අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් තැන්පතු ගිණුමේ දක්වන ලද ශේෂය වැඩියෙන් දක්වා තිබුණු අතර කෙරීගෙන යන වැඩවල ශේෂය ඒ සමාන ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2017 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන පහත දැක්වේ.

| ප්‍රභවය | ව්‍යාපෘති ගිවිසුමට අනුව මූල්‍යයනය කිරීම සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ඇස්තමේන්තුවේ ඇතුළත් කරන ලද අයවැයගත ප්‍රතිපාදනය | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2017 දෙසැම්බර් 31 දිනට | |
| | ඇ.ඩො. මිලියන | රු.මිලියන | රු.මිලියන | ඇ.ඩො. මිලියන | රු. මිලියන | ඇ.ඩො. මිලියන | රු.මිලියන |
| ආ.සං.බැ. | 180.00 | 23,326.20 | 4,998.00 | 13.41 | 2,051.00 | 18.90 | 2,891.00 |
| ශ්‍රී ලංකා රජය | 40.00 | 5,183.60 | - | - | - | - | - |
| ලංවිම | - | - | 417.00 | 3.16 | 483.00 | 6.45 | 987.20 |
| **එකතුව** | **220.00** | **28,509.80** | **5,415.00** | **16.57** | **2,534.00** | **25.35** | **3,878.20** |

වැඩසටහනේ ක්‍රියාකාරකම් ආරම්භ කරන ලද දිනෙන් වසර 03 කට පසුව ද, 2017 දෙසැම්බර් 31 දිනට ඇ.ඩො. මිලියන 180 ක් වූ රු. මිලියන 23,326.20 කට සමාන වූ ප්‍රතිපාදන වෙන් කිරීම්වලින් සියයට 12 ක් නියෝජනය කරන ඇ.ඩො. මිලියන 18.90 ක් හෙවත් රු. මිලියන 2,891 ක් භාවිත කර තිබුණු බව නිරීක්ෂණය කළ හැකි විය. එම නිසා, ව්‍යාපෘතියේ ඉතිරි කාලසීමාව වන වසර 03 තුළ සම්පූර්ණ ණය වෙන් කිරීම භාවිත කිරීමේ හැකියාව පිළිබඳව සැකයක් පවතී.

### 3.2 භෞතික ප්‍රගතිය

ලබා දී ඇති තොරතුරුවලට අනුව, වැඩසටහනේ ක්‍රියාකාරකම් ප්‍රධාන කොටස් 04 කින් සමන්විත වන අතර සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම්වල ප්‍රගතිය පහත විස්තර කර ඇත.

(අ) ජල විදුලිබල උත්පාදන ධාරිතාව ඉහළ නැංවීමේ අරමුණින් මොරගොල්ලේ ජල විදුලි බලාගාරය ඉදිකිරීම සඳහා වන ලංසු ලේඛන සමාලෝචනය කිරීම වෙනුවෙන් උපදේශන සේවා කොන්ත්‍රාත්තුව 2016 ඔක්තෝබර් 24 දින ප්‍රදානය කර තිබුණ ද, උපදේශක සමාගම වැඩ ආරම්භ කර තිබුණේ 2016 දෙසැම්බර් 01 දිනය. ලැබුණු තොරතුරුවලට අනුව, ජලාශයේ වේල්ල නැවත සැලසුම් කිරීමේ කටයුතු සහ ලංසු ලේඛන සමාලෝචනය කිරීමේ කටයුතු 2017 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණ කරන ලදී. තවද, මොරගොල්ලේ ජල විදුලි බලාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු 2017 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණ වී නොතිබුණි. අනුමතිය ලබාදීම සඳහා මෙන්ම පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ අරමුණු සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම්වලට අනුව, ජලාශයේ වේල්ල නැවත සැලසුම් කිරීමට කාලය ගත වීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දින වන විට ද සිවිල් ඉදිකිරීමේ වැඩ සඳහා කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සහ යාන්ත්‍රික සහ විද්‍යුත් පහසුකම් සැපයීමේ කටයුතු ඒවායේ මූලික අදියරවලම ඉතිරිව පැවතුණි.

(ආ) කප්පයිතුරේ විදුලි උපපොළේ ඉදිකිරීමේ කටයුතුවල භෞතික ප්‍රගතිය සහ විද්‍යුත් සම්ප්‍රේෂණ යටිතල පහසුකම් ධාරිතාව ඉහළ නැංවීම සඳහා සිදු කළ යුතු කෙරවලපිටිය, කටුනායක සහ ත්‍රිකුණාමලය යන විදුලි උපපොළවල වැඩි දියුණු කිරීමේ කටයුතුවලින් සියයට 42 ක් 2017 දෙසැම්බර් 31 දින වන විට ද ඉතිරි වී තිබුණි. තවද, කැස්බෑව සහ කළුතර විදුලි උපපොළවල ඉදිකිරීමේ කටයුතුවල භෞතික ප්‍රගතිය සහ අනුරාධපුර පැරණි විදුලි උපපොළේ වැඩි දියුණු කිරීමේ කටයුතුවලින් සියයට 30 ක් 2017 දෙසැම්බර් 31 දින වන විට ද ඉතිරි වී තිබුණ අතර කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීමේ ප්‍රමාදය හේතුවෙන් ආශ්‍රිත සම්ප්‍රේෂණ මාර්ගවල ඉදිකිරීමේ කටයුතුවලින් සියයට 34 ක් 2017 දෙසැම්බර් 31 දින වන විට ද ඉතිරි වී පැවතුණි.

(ඇ) ලංකා විදුල බල මණ්ඩලය මගින් කිලෝමීටර් 92 ක දිගින් යුත් මධ්‍යම වෝල්ටීයතා මාර්ග 33 ක් සවි කිරීම යටතේ සිදු කළ යුතු වැඩවල භෞතික ප්‍රගතිය සහ මධ්‍යම වෝල්ටීයතා ජාලයේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා වවුනතිවු සහ මාදම්පේ ගැන්ට්‍රි ඉදිකිරීම යටතේ සිදුවන කටයුතුවල භෞතික ප්‍රගතිය ලංකා විදුලිබල මණ්ඩලය මගින් සිදු කළ මූලික මාර්ග ඉවත් කිරීමේ කටයුතුවල සිදු වූ ප්‍රමාදය සහ ආකෘති සැලසුම් කිරීමේ දී සිදු වූ ප්‍රමාදය හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දින වන විට සියයට 60 ක් වී තිබුණි.

(ඇ) බලශක්ති කාර්යක්ෂමතාව සඳහා ඉල්ලුම කළමනාකරණය වැඩිදියුණු කිරීම යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත තාප ගබඩා නියමු ව්‍යාපෘතිය සහ ස්මාර්ට් ගොඩනැගිලි නියමු ව්‍යාපෘතිය නිසි හේතු නොමැතිව පසුව අවලංගු කර ඇති බව නිරීක්ෂණය විය. තවද, බලශක්ති අංශයේ සංවර්ධනය, පද්ධති හා පිටත් කර යැවීම් සහ බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා ආයතනික ධාරිතාව සඳහා උපදේශන සේවා සැපයීම යටතේ ක්‍රියාකාරකම් 2017 දෙසැම්බර් 31 දින වන විට ආරම්භ කර නොතිබුණි.

**3.3 මතභේදයට තුඩු දෙන කරුණු**

-----------------------------

පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

(අ) අදාළ ප්‍රදේශවල පවතින වෙළඳපොළ අනුපාතවලට වඩා අධික මිලකට, එනම් එක් නිවසක් සඳහා මසකට රු.400,000 ක් ගෙවමින් මාදම්පේ, වවුනතිවු සහ යුරානි ප්‍රදේශවල පිහිටි නිවාස 03 ක් කුලියට ගනිමින් 2017 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 17.07 ක් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබුණි.

(ආ) වැඩසටහනේ කාර්ය මණ්ඩලය සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීමට කොන්ත්‍රාත්කරු මගින් ප්‍රසම්පාදනය කරන ලද මෝටර් වාහන 05 ක් සඳහා මාසික ධාවන සටහන් වැඩසටහන මගින් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර එම ධාවන සටහන් වෙනුවට පරිශ්‍ර ඉංජිනේරුවන් විසින් සහතික කරන ලද ගමන් සටහන් ඉදිරිපත් කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ඉන්ධන සහ නඩත්තු පිරිවැය වශයෙන් කොන්ත්‍රාත්කරු වෙත ගෙවන ලද රු. මිලියන 13.53 ක මුදල සෑහීමකට පත් ව සහතික කළ නොහැකි මුදල්ක් වන අතර විගණනය සඳහා ද එය පිළිගත නොහැකිය.

## 3.4 මූල්‍ය පාලනය පිළිබඳ ගැටළු

පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

(අ) 2010 ජූලි 26 දිනැති අංක 05 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ මූල්‍ය රෙගුලාසි 134 (3) මගින් සහ පහසුකම් පරිපාලන සංග්‍රහයේ වගන්ති 26 සහ 27 මගින් දක්වා ඇති අවශ්‍යතාව පරිදි, ව්‍යාපෘතියේ ගනුදෙනු ලංකා විදුලිබල මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශයේ විගණනයට යටත් කර නොමැත.

(ආ) වැඩසටහනේ ක්‍රියාකාරකම් කොටස් පහකින් සමන්විත වූ අතර ලංකා විදුලිබල මණ්ඩලය මගින් පාලනය කරනු ලබන පරිත්‍යාගශීලීන් විසින් අරමුදල් සපයනු ලබන සියලුම ව්‍යාපෘති අධීක්ෂණය කිරීම අතිරේක සාමාන්‍යාධිකාරිවරයකුට පවරනවා වෙනුවට වැඩසටහනේ එවැනි කොටස්වලට අයත් ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම සහ නියාමනය කිරීම ලංකා විදුලිබල මණ්ඩලයේ විවිධ අංශ ප්‍රධානීන්ගේ විෂය පථය යටතේ පැවතුණි.

(ඇ) ව්‍යාපෘති ගිවිසුමේ 2.09 (අ) වගන්තිය ප්‍රකාරව පරිත්‍යාගශීලීන් විසින් අරමුදල් සපයනු ලබන ව්‍යාපෘති සඳහා වෙන වෙනම ලෙජර් ගිණුම් සහ වෙනත් මූල්‍ය වාර්තා පවත්වා ගැනීම සඳහා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය මගින් පියවර ගෙන නොතිබුණ අතර සමාලෝචිත වසර සඳහා මූල්‍ය ප්‍රකාශන සටහන් පත්‍ර (Memorandum) පදනමින් පිළියෙළ කර තිබුණි.

(ඈ) වැඩසටහනේ ක්‍රියාකාරකම් අනුපූරණය කිරීමේ ප්‍රමාදය හේතුවෙන් රු. මිලියන 27.21 ක් වන බැඳීම් ගාස්තු 2017 දෙසැම්බර් 31 දින වන විට ණය දෙන නියෝජිතායතනය මගින් ආපසු අය කර ගෙන තිබුණි.